# වයඹ පළාතේ කෘෂි ආර්ථික සම්පත්

ඩබ්. ඒ. ජයරත්න
අංශ ප්‍රධාන, සැලසුම් කිරීම හා ඇගයීම
ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**වයඹ පළාත ප්‍රධාන පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් එනම්, කුරුණෑගල සහ පුත්තලම් දිස්ත්‍රික්කයෙන් සමන්විත වර්ග කි.මී. 7825 ක පමණ භූමි ප්‍රමාණයකින් යුක්ත වේ. මෙහි ස්වාභාවික දයාද වශයෙන් ලැබුණු සාරවත් භූමි 1/2 ක් මෙන්ම විවිධ රජයන් විසින් ස්ථාපිත කරන ලද මෑත කාලීන ආර්ථික සම්පත් මෙන්ම පැරණි රජ දරුවන් විසින් ඉදිකරන ලද වැව් අමුණු, මහා මාර්ග, පැරණි සිද්ධස්ථාන වලින් යුක්ත ප්‍රදේශයකි. මෙහි ජනගහනය 1987 සංඛ්‍යාලේඛණ වලට අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයේ 1340620 ක් ද, පුත්තලම් දිස්ත්‍රික්කයෙන් 538604 බැගින් ද වන අතර ග්‍රාමීය ජන සංයුතිය කුරුණෑගල දිස්ත්‍රික්කයේ 95% ක්ද, පුත්තලම් දිස්ත්‍රික්කයේ 86% ක් ද වේ. මෙයින් වයඹ පළාතේ පිරිමි ජනගහනය කුරුණෑගල දිස්ත්‍රික්කයේ 671334 ක්ද, පුත්තලම් දිස්ත්‍රික්කයේ 268218 ගැහැණු ජනගහනය කුරුණෑගල දිස්ත්‍රික්කයේ 669270 ක් ද වේ. පුත්තලම් දිස්ත්‍රික්කයේ 269386 ක් ද වන බව ගණන් බලා ඇත.**

මෙහි කෘෂිකාර්මික කටයුතු සඳහා යහපත් දේශගුණික රටාවක් ඇති බව පෙනී යයි. විශේෂයෙන් කුරුණෑගල කළාපය තෙත් කළාපීය මෙන්ම අන්තර් කළාපීය දේශගුණික තත්ත්ව පෙන්නුම් කරන අතර උතුරු කොටස වියළි දේශගුණික ස්වභාවයක් පෙන්නුම් කරයි. පුත්තලම් කළාපය ප්‍රධාන වශයෙන් අන්තර් දේශගුණික කළාප හා වියළි කළාප දේශගුණික තත්ත්වය පෙන්නුම් කරන අතර, මෙම කළාප 2 හිම සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය කුරුණෑගල දිස්ත්‍රික්කයේ මි.මී. 1491 ක් ද පුත්තලම් දිස්ත්‍රික්කයේ මි.මී. 1298 ක් ද ලෙස වාර්තාවේ.

මෙහි දී වඩාත් වැදගත් වන්නේ ප්‍රදේශය පුරා ඉදිකර ඇති කුඩා හා මහා වාරිමාර්ග පද්ධති යයි. නිද. ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුඩා වැව් 3600 ක් ද මහා වාරි මාර්ග යෝජනා ක්‍රමය 9 ක් ද පුත්තලම දිස්ත්‍රික්කයේ කුඩා වාරිමාර්ග 1450 ක් ද ප්‍රධාන වාරිමාර්ග ක්‍රම 17 ක් ද 1990 වන විට ඇති බව වාර්තා විය.

තවද ප්‍රදේශය පුරා ක්‍රමානුකූල ප්‍රවාහන රටාවක් තිබීම ද ආර්ථික කටයුතු වර්ධනයේ ලා වැදගත් කමක් උසුලයි. මෙහි දී විශේෂයෙන් ම කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහා මාර්ග කි.මී. 2283 ක් ද පුත්තලම් දිස්ත්‍රික්කයේ මහා මාර්ග කි.මී. 1041 ක් ද ඇති බව ගණන් බලා තිබේ. ප්‍රධාන වශයෙන් කෘෂි කාර්මික කලාපයක් වන මෙය පොල්, වී සහ අතිරේක බෝග වගා කිරීමට ප්‍රසිද්ධියක් උසුලයි. නිදසුන් ලෙස කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහ පුත්තලම් දිස්ත්‍රික්කයේ පොල් ඉඩම් හෙ.යා. 149106 ක් ද වී. හෙ.යා. 41160 ක් ද පුත්තලම් දිස්ත්‍රික්කයේ පොල් ඉඩම් හෙ.යා. 51781 ක් ද වී. 13,532 ක් ද 1991 වනවිට වගා කර ඇති බව පැහැදිලි විය. පසුගිය දශ අවුරුද්දකට ආසන්න කාලයක් තුළ කෘෂි කාර්මික මෙන්ම කාර්මික අංශයේ ද වර්ධනයක් මෙම ප්‍රදේශය තුළ සිදු වී ඇති බව සංඛ්‍යා ලේඛණ වලින් හෙලි දරව් වේ. විශේෂයෙන් ම කුරුණෑගල දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කටයුතු අතින් ද පුත්තලම දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කටයුතු වලට අතිරේකව මිරිදිය සහ කරදිය මසුන් ඇල්ලීමේ කර්මාන්තය ද වර්ධනය වී ඇති බව සංඛ්‍යා ලේඛන වලින් හෙළි දරව් වී ඇත. විශේෂයෙන් ම මෙම ප්‍රදේශය පුරා විහිදී පවතින දැදුරු ඔය, මහඔය, කළාඔය, මී ඔය හා ප්‍රබල ඔය නිසා ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජල සම්පාදන කටයුතු කාර්යක්ෂමව කිරීමට ඉවහල් වී තිබේ.

ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වල දී ඉතාමත් ම වැදගත් සම්පතක් ලෙස ප්‍රදේශයේ උගත් තරුණ පිරිස සැළකිය හැකිය. මේ බව හඳුනාගත් ප්‍රතිපත්ති සම්පාදකයන්, ප්‍රදේශයේ තරුණ තරුණියන් විවිධ කෘෂි කාර්මික කර්මාන්ත කටයුතු සඳහා විධිමත් පුහුණු ක්‍රම මාර්ගයෙන් සංවර්ධනයට හවුල් කර ගැනීමේ ක්‍රමික වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් වයඹ පළාත පුරා තරුණ තරුණියන් විවිධ ආර්ථික කාර්යයන් වලට පුහුණු කිරීමේ මධ්‍යස්ථාන රාශියක් පසුගිය දශක 11/2 පමණ කාලය තුළ රජය මගින් ක්‍රියාත්මක කර ඇති බව පෙනී යයි. නිදසුනක් ලෙස රජය මගින් ආරම්භ කරන ලද වයඹ පළාතේ පුහුණු මධ්‍යස්ථාන පහත ලේඛණයෙන් දැක් වේ.

**රජය විසින් ආරම්භ කරන ලද වයඹ පළාතේ පුහුණු මධ්‍යස්ථාන**

| ආයතනයේ නම | ආයතන සංඛ්‍යාව |
|---|---|
| 1. කම්කරු දෙපාර්තමේන්තුව | 29 |
| 2. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | 53 |
| 3. ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුව | 13 |
| 4. පේෂකර්ම දෙපාර්තමේන්තුව | 28 |
| 5. ජාතික තරුණ සේවා සභාව | 07 |
| 6. කාර්මික සංවර්ධන මණ්ඩලය | 01 |
| 7. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 01 |
| 8. ජාතික සත්ව නිෂ්පාදන සංස්ථාව | 01 |
| 9. අධ්‍යාපන අමාත්‍යංශය | 02 |

ඉහත දක්වන ලද ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථාන වලට අතිරේකව ප්‍රදේශය පුරා රජයේ නොවන ආයතන විසින් ක්‍රියාත්මක කෙරෙන ලුහු ඉංජිනේරු මධ්‍යස්ථාන, සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථාන, ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථාන වැනි ආයතන රාශියක් ද දක්නට ලැබේ. 1991 සංඛ්‍යා ලේඛන වලට අනුව වයඹ පළාතේ පුහුණු සංඛ්‍යාව ලක්ෂ 7 කට ආසන්න බව ගණන් බලා තිබේ. මෑතක දී රජය විසින් ප්‍රාදේශීය විශ්ව විද්‍යාලයක් ද අරම්භ කිරීමට පියවර ගන්නා ලදී. තව ද ප්‍රදේශයේ ආයතන අතරට කාර්මික තොරතුරු සපයන වයඹ කාර්මික තොරතුරු මධ්‍යස්ථානය වයඹ අපනයන සංස්ථාව වැනි රාජ්‍ය ආයතන තුළින් ද විවිධ ආර්ථික කටයුතු වල නියුක්ත ප්‍රදේශවල අය සඳහා විවිධ මට්ටමේ සේවාවන් සපයන බව ඉතා වැදගත් කරුණකි.

වයඹ පළාතේ ආර්ථික කටයුතු සංවර්ධනයේ කොඳු නාරටිය වශයෙන් සැලකෙන්නේ කෘෂිකාර්මික අංශයයි. මෙම ප්‍රදේශය දේශීය පාරිභෝගිකයාට අවශ්‍ය සහල්, පොල්, එළවළු පළතුරු අතිරේක ආහාර ද්‍රව්‍ය කුළු බඩු නිෂ්පාදනය මෙන්ම අපනයන කර්මාන්ත සඳහා දියුණු කළ හැකි පළතුරු, එළවළු වගා කිරීම සඳහා ද අවශ්‍ය පරිසරයක් දක්නට ලැබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රජය විසින් වයඹ පළාත දේශීය එළවළු වෙළඳ පොලට මෙන්ම විදේශ වෙළඳ පොලට ද සැපයිය හැකි කෘෂිකාර්මික ද්‍රව්‍ය

විශේෂ කලාපයක් වශයෙන් නම් කර තිබේ. තව ද, ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ රැකියා ව්‍යාප්තියට විසඳුමක් වශයෙන් කර්මාන්ත අංශයට අවශ්‍ය අමු ද්‍රව්‍ය සැපයීම ද වයඹ පළාතේ ආර්ථික කටයුතු සැලසුම් කිරීමේ ප්‍රධාන අංගයක් ලෙස හඳුනා ගෙන ඇත. මේ සඳහා දේශීය මෙන්ම විදේශීය ආයෝජනයන් ප්‍රදේශයට ඇද ගැනීම විශේෂ වැඩ පිළිවෙලක් පසුගියකාලය තුළ සිදු කර ඇති බව අමතක නොකළ යුතු කරුණකි. මෙහි අවශ්‍යතාව වශයෙන් උසස් තත්ත්වයේ බීජ මෙන්ම නවීනකෘෂි ද්‍රව්‍ය සඳහා අවශ්‍ය බීජ සැපයීමේ අවශ්‍යතාව ද රජය විසින් හඳුනා ගෙන තිබේ. නිදසුන් ලෙස වයඹ පළාත් සභාව විදේශීය වෙළඳ පල කටයුතු සඳහා කජු සැපයීමේ ව්‍යාපෘතියක් ජපන් සමාගම් කීපයක් සමග ද දේශීය සමාගම් කිහිපයක් ද සමග සහයෝගීතාවය ප්‍රදේශය පුරා ව්‍යාප්ත කර තිබේ.

මෙම ව්‍යාපෘතිය යටතේ පවුල් 750කට පමණ ජීවන මාර්ගයක් වශයෙන් කජු සැකසීමේ කර්මාන්තය හඳුන්වාදීමට පියවර ගෙන ඇත මීට අතිරේකව වයඹ පළාත් සභාව විසින් හෙ.යා. 30,000 ක කජු වගා කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. මෙයින් විදේශීය වෙළඳ පොල සඳහා කජු සැකසීම ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි.

වයඹ පළාත අප රටේ වැවෙන පළතුරු වර්ග වලින් වැඩි ප්‍රමාණයක් වගා කිරීමට සුදුසු දේශගුණික රටාවක් ඇති ප්‍රදේශයක් බව ඉහතින් දක්වන ලදී. ඒ අනුව අඹ, අන්නාසි, කෙසෙල්, දොඩම්, දෙහි, ගස්ලබු, කොස්, පැෂන්-ෆෲට්, අලිගැට පේර වැනි දේශීය මෙන්ම විදේශීය ඉල්ලුමක් ඇති පළතුරු වර්ග වගා කිරීම සඳහා ද විශේෂ අවධානය යොමු කර තිබේ. මෙම පළතුරු දේශීය වෙළඳ පොලට මෙන්ම මැද පෙරදිග, මාලදිවයින්, නෙදර්ලන්තය, ජර්මනිය වැනි යුරෝපීය වෙළඳ පල සඳහා ද ඉලක්ක කර ගෙන තිබේ. දැනටමත් මේ සඳහා විවිධ ඇනවුම් ලබා ගෙන ඇති අතර විවිධ සමාගම් මගින් සැපයීම් කර තිබේ.

මෙහි අවශ්‍යතාවයක් වශයෙන් පළතුරු සැකසීමේ හා ඇහිරීමේ කර්මාන්ත ශාලා කිහිපයක් ද ආරම්භ කිරීමට ද සැලසුම් කර ඇත. දැනට මෙම පළතුරු වර්ග ගොවීන් විසින් කුඩා වගා බිම්වල වගා කෙරෙන අතර වඩාත් වාණිජ වගාවන් වශයෙන් දියුණු කිරීමට රජය විසින් විවිධ දිරි ගැන්වීම් ක්‍රම හඳුන්වා දී තිබේ. වයඹ පළාත වර්ෂය පුරාම නිෂ්පාදනය කළ හැකි පළතුරු වර්ග වගා කළ හැකි ප්‍රදේශයක් ලෙස දැනට හඳුනා ගෙන තිබේ. මෑත දී මිදි වගාවද ප්‍රදේශයේ ව්‍යාප්ත කළ බව හෙළිදරව් වී තිබේ.

පළතුරු වගාවට අතිරේකව අළුතින් හඳුන්වා දී ඇති අපනයනය කළ හැකි ගර්කින්ස්, සුදු පැහැති එළුණු,පැණි කොහොල් වැනි බෝග ද ප්‍රදේශයේ වගා කළ හැකි බව ද පෙන්වා දී ඇත. තව ද මෙම ප්‍රදේශය අපනයනය සඳහා විවිධ වර්ගයේ මල්පැළැටි සාර්ථකව වගා කළ හැකි බව ද පර්යේෂණ වලින් හෙළි දරව් වී තිබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බැංකු සමාගම් අපනයනය සඳහා මල් වැවීමට වයඹපළාත තෝරා ගෙන තිබේ. ඒ අනුව ස්වීඩනය, චීනය, නෙදර්ලන්තය, ජපානය වැනි රටවල් ද ඒකාබද්ධව මල් වැවීමේ කර්මාන්තය දියුණු කිරීම සඳහා ව්‍යාපෘති ගණනාවක්ද ක්‍රියාත්මක වෙමින් පවතී.

තවත් ප්‍රදේශයේ පැහැදිලි අනාගතයක් ඇති වගාවක් ලෙස පටපණු කර්මාන්තය හඳුනා ගෙන තිබේ. විශේෂයෙන්ම මල්බෙරි වගාව සාර්ථකව කළ හැකි දේශගුණික පරිසරයක් පවතින බව මෙහි දී සඳහන් කළ හැකිය. . ඒ යටතේ මල්බෙරි කර්මාන්තය ප්‍රධාන වාණිජ කාර්යයක් ලෙස දියුණු කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන තිබේ. මෙහි දී මල්බෙරි වගාව පට පනුවන් බෝ කිරීම සිල්ක් කර්මාන්තය ආදී කර්මාන්ත ගණනාවක් ක්‍රමානුකූලව වර්ධනය කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වෙමින් පවතී.

වයඹ පළාත ලංකාවේ පොල් නිෂ්පාදනය සඳහා ප්‍රසිද්ධියක් උසුලන බව ප්‍රකට කරුණකි. විශේෂයෙන් පළාතේ වගා උස් බිම් වලින් 22% ක් පමණ කුරුණෑගල-පුත්තලම ප්‍රදේශවල පොල් වගාව සඳහා වෙන් වී පවතී. තව ද කොළඹ දිස්ත්‍රික්කය ඇතුළු කළ විට මුළු පොල් වගාවෙන් 66%ක් වයඹ හා කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන බව හෙළි දරව් වී තිබේ.

තව ද, වයඹ පළාතේ අක්කර 496298 ක් එනම්, පොල් වගාව සඳහා වෙන් වී පවතී. පොල් කර්මාන්තය ඊට ආවේනික වූ අතිරේක කර්මාන්ත රාශියක් හා සම්බන්ධ අංශයකි. පොල් නිෂ්පාදනය, තෙල් නිෂ්පාදන, කැබූ පොල් නිෂ්පාදනය, කොහු කර්මාන්තය, පොල් කටු අතුරු කර්මාන්තය, ඉරටු සැකසීම වැනි අතුරු කර්මාන්ත රාශියක් ප්‍රදේශය පුරා ව්‍යාප්තව පවතී. මෙම නිෂ්පාදන සඳහාදේශීය මෙන්ම විදේශීය වෙළඳ පල ද විවෘතව පවතී. ප්‍රදේශයේ විශාල ජනතාවක් පොල් කර්මාන්තය හා ආශ්‍රිත කර්මාන්ත වල නියැලී ඇති බව පෙනී ගොස් ඇත. සංඛ්‍යා ලේඛණවලට අනුව ලංකාවේ කැබූ පොල් නිෂ්පාදනය, පොල් තෙල් නිෂ්පාදනය, කොප්පරා නිෂ්පාදනය, කොහු කර්මාන්තය යන අංශ වලින් 75% ක් පමන වයඹ පළාත දයක වන බව හෙළි දරව් වී තිබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වයඹ පළාතේ කැබූ පොල් නිෂ්පාදන කර්මාන්ත ශාලා කිහිපයක් ම ප්‍රදේශයේ අපනයන කටයුතුවල නියුක්ත වී සිටී.

පොල් වගා බිම් ආශ්‍රිතව ප්‍රදේශයේ දියුණු කළ හැකි වැදගත් කර්මාන්තයක් වශයෙන් සත්ත්ව පාලන අංශය හඳුනා ගෙන ඇත. පොල් වගා බිම් වලින් 75% ක් පමණ සත්ත්ව පාලන කටයුතු සඳහා යොද ගත හැකි බව පෙනී ගොස් තිබේ. එබැවින් වයඹ පළාත් කිරි හා මස් පිණිස ගවයන් ඇති කිරීම, එළු පාලනය, කුකුල් පාලනය, ප්‍රධාන සත්ව පාලන වශයෙන් රජය හඳුනා ගෙන ඇති අතර ඒ සඳහා විදේශීය සමාගම් වල උපකාරය යටතේ ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කර තිබේ. එමගින් ප්‍රදේශය පුරා විහි දී සිටින අතිරේක ආදයම් මාර්ග සැපයීම මෙන්ම ප්‍රදේශයේ තරුණ තරුණියන්ට රැකියා මාර්ග සැපයීම ද බලාපොරොත්තු වේ.

විශේෂයෙන් ම පුත්තලම් දිස්ත්‍රික්කය ධීවර කර්මාන්තය අතින් වැදගත් කමක් උසුලන ප්‍රදේශයකි. අපනයනය සඳහා ඉස්සන් බෝ කිරීම වඩා ලාභදායී කර්මාන්තයක් වශයෙන් ප්‍රදේශය පුරා ව්‍යාප්ත වෙමින් පවතී. දැනට වයඹ පළාතේ හෙ.යා. 200 ක පමණ ප්‍රදේශයක විවිධ ප්‍රමාණයේ ඉස්සන් බෝ කිරීමේ ජලාශ ඉදි කර ඇති බව හෙළිදරව් වී තිබේ. එසේ වුව ද මෙහි දී කරදිය නිසා සිදු විය හැකි පරිසර හානිය කෙරෙහි ක්‍රමවත් පාලනයක් නැති බව ද සඳහන් කළ යුතු ය.

කෙසේ වුව ද පුත්තලම් දිස්ත්‍රික්කයේ ආශ්‍රිත කලපුව ධීවර කර්මාන්තය දියුණු කළ හැකි ප්‍රදේශයක් බව අමතක නොකළ යුතු ය. කරදිය මත්ස්‍ය කර්මාන්තය මෙන්ම පළාත පුරා විහිදී ඇති දහස් ගණන් සුළු සහ මධ්‍යම ප්‍රමාණයේ ජලාශ වලට මිරිදිය කර්මාන්තය දියුණු කිරීමේ ඉඩ ප්‍රස්ථා ද තිබේ.

වයඹ පළාත් විවිධ කර්මාන්ත වලට අවශ්‍ය ස්වාභාවික සම්පත් වලින් හෙබි ප්‍රදේශයක් බව ද සඳහන් කළ යුතුය. කර්මාන්ත සඳහා අවශ්‍ය මැටි, මිණිරන්, ග්‍රැෆයිට් ආදිය ප්‍රදේශයේ ඇති බව සමීක්ෂණ වලින් හෙළිදරව් වී තිබේ.

ඉහතින් සඳහන් කරන ලද කෘෂි කර්මාන්ත වලට අතිරේකව ප්‍රදේශය විවිධ කර්මාන්ත වලින් යුක්ත කලාපයක් ලෙස දියුණු කිරීමේ අභිලාශයෙන් පසුගිය වර්ෂ කිහිපය තුළ රජය විසින් පියවරයන් කිහිපයක් ම ගෙන තිබේ.